# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2017 අංක 29 දරන අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2017 නොවැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2017 නොවැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 16.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2017 අංක 29 දරන අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 නොවැම්බර් මස 18 වන දින]

එල්.ඩී.— ඕ. 7/2015

**(22 වන අධිකාරය වූ) අපරාධ වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2017 අංක 29 දරන අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (22 වන අධිකාරය වූ) (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධ වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ "අපරාධ නඩු විධාන සංග්‍රහයේ 302 වන වගන්තිය මගින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 277 වන වගන්තිය මගින්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 22 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධන කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "අපරාධ නඩු විධාන සංග්‍රහයේ 190 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 325 (1) වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 185 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, එකී පනතේ 306 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ, (1) වන උපවගන්තියේ "පොලීසිය විසින් අධීක්ෂණය කිරීමට යටත්ව" යන වචන වෙනුවට "17 වන වගන්තිය යටතේ සාදන ලද රීති මගින් නියම කර ඇති පරිදි පොලීසිය විසින් අධීක්ෂණය කිරීමට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

2—PL 005359 -2862 (2017/08)

(2) ඒ වගන්තියේ, (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු අපරාධයකට වරදකරු වීමේ දී එම තැනැත්තාට අත්හිටවූ දණ්ඩන නියමයක් පනවනු ලැබූ අවස්ථාවක දී එම අත්හිට වූ දණ්ඩන නියමය පනවනු ලැබූ දින සිට එම දණ්ඩන නියමය ක්‍රියාත්මක වන කාලය අවසන් වන තුරු 17 වන වගන්තිය මගින් සාදන ලද රීති මගින් නියම කර ඇති පරිදි, එම තැනැත්තා පොලීසිය විසින් අධීක්ෂණය කිරීමට යටත් කළ යුතු බවට අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) එසේ සාදනු ලබන සෑම රීතියක්ම—

(අ) ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින සිට මාස හයක කාලයක් තුළ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන දිනයක සිට හෝ එම රීතිවල නිශ්චිතව දක්වනු ලබන මතු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "අපරාධය" යන වචනයේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

" "අපරාධය" යන්නෙන්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් පනත යටතේ ලැයිස්තු ගත කර ඇති යම් වගන්ති යටතේ දඬුවම් කළ හැකි වරදක් අදහස් වේ;"; සහ

(2) "රෙජිස්ට්‍රාර්" යන වචනයේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:—

" "රෙජිස්ට්‍රාර්" යන්නෙන්, ඇඟිලි සලකුණු රෙජිස්ට්‍රාර්වරයා අදහස් වන අතර, ඊට ඇඟිලි සලකුණු අතිරේක රෙජිස්ට්‍රාර්වරයා, ඇඟිලි සලකුණු නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු සහ ඇඟිලි සලකුණු සහකාර රෙජිස්ට්‍රාර්වරයකු ද ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය මෙයින් ආදේශ කරනු ලැබේ:—

"උපලේඛනය [18 වන වගන්තිය]

**(26 වන අධිකාරය වූ) අල්ලස් පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 14 | අධිකරණ නිලධාරීන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අල්ලස්. |
| (ii) | 15 | රජයේ සේවකයන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තුටු පඬුරු භාර ගැනීම. |
| (iii) | 16 | පොලිස් නිලධාරීන්, සාම නිලධරයන් සහ වෙනත් රජයේ සේවකයන් විසින් අල්ලස් ලබා ගැනීම. |
| (iv) | 17 | කොන්ත්‍රාත්වලට අදාළව සහාය ලබාදීම සඳහා හෝ බලපෑම් කිරීම සඳහා අල්ලස් ලබා ගැනීම. |
| (v) | 18 | ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලා අස්කර ගැනීම සඳහා අල්ලස් ලබා ගැනීම. |
| (vi) | 19 | ආණ්ඩුවේ කටයුතු සම්බන්ධයෙන් අල්ලස් ලබා ගැනීම. |

| | | |
|---|---|---|
| (vii) | 20 | හිමිකම් පෑම් සඳහා මුදල් ගෙවීම, පත්වීම් ලබාදීම, සේවා නියුක්තිය, ප්‍රදාන සහ වෙනත් ප්‍රතිලාභ හා අල්ලස් ලබා ගැනීම. |
| (viii) | 21 | ආණ්ඩුව සමඟ ගනුදෙනු ඇති තැනැත්තන් විසින් රජයේ සේවකයන්ට අල්ලස් ලබාදීම. |
| (ix) | 22 | පළාත් පාලන ආයතනයක සභිකයකු විසින් හෝ උපලේඛනගත ආයතනයක සාමාජිකයකු හෝ ඒ ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයකු විසින් අල්ලස් ලබා ගැනීම සහ පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක නිලධරයන් හෝ සේවා නියුක්තකයකු විසින් අල්ලස් ගැනීම. |
| (x) | 23 | පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලක මණ්ඩලයේ මන්ත්‍රීවරුන්ගේ හෝ සාමාජිකයකුගේ ඡන්දයට බලපෑම් කිරීම සඳහා තර්ජන කිරීම සහ වංචා කිරීම. |
| (xi) | 23 අ | මේ වගන්තිය යටතේ අල්ලස් ලබා ගැනීමෙන් අත්කර ගත් දේපළ බවට සලකනු ලබන දේපළ හෝ අල්ලස් ලබා ගැනීමෙන් අත්කර ගත් දේපළ පරිවර්තනය කරනු ලැබ ඇති හෝ කරනු ලැබ තිබූ දේපළ අයත්ව සිටීම හෝ අයත්ව සිට තිබීම. |
| (xii) | 24 | අදාළ කාර්ය ඉටු කළ ද, නැති වුව ද, එය නොතකා අල්ලස් ලබා ගැනීම යනාදිය වරදක් බව. |
| (xiii) | 25 | II වන කොටස යටතේ වරදක් කිරීමට තැත් කිරීම සහ වරදකට අනුබල දීම. |
| (xiv) | 70 | දූෂණය. |

**1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 21 | අසත්‍ය චෝදනා කිරීම වරදක් බව. |
| (ii) | 22 | රහස්‍යතාවය පිළිබඳ විධිවිධාන කඩකිරීම වරදක් බව. |
| (iii) | 23 | විවිධ වැරදි. |

**2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත**

| වගන්තිය | | වරදේ ස්වභාවය |
|---|---|---|
| (i) | 3 | පරිගණකයකට නීත්‍යානුකූල නොවන ප්‍රවේශයක් අත්කර ගැනීම. |
| (ii) | 4 | වරදක් සිදු කිරීම උදෙසා නීත්‍යානුකූල නොවන ප්‍රවේශයක් අත්කර ගැනීම සඳහා යම් ක්‍රියාවක් සිදු කිරීම. |
| (iii) | 5 | අධිකාරි බලය නොමැතිව පරිගණකයකට කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීම. |
| (iv) | 6 | ජාතික ආරක්ෂාව ආදියට එරෙහිව කරනු ලබන වැරදි. |
| (v) | 7 | නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ලබාගත් දත්ත ආදිය සමඟ කටයුතු කිරීම. |
| (vi) | 8 | නීති විරෝධී ලෙස දත්ත අත්කර ගැනීම. |
| (vii) | 9 | වරදක් කිරීම සඳහා නීති විරෝධී උපක්‍රම සැපයීම වරදක් බව. |
| (viii) | 10 | සේවාවකට ප්‍රවේශ වීමට නීත්‍යානුකූල බලයක් නොමැතිව තොරතුරු අනාවරණය කිරීම. |
| (ix) | 11 | වරදක් සිදු කිරීමට තැත් කිරීම. |
| (x) | 12 | වරදක් සිදු කිරීමට අනුබල දීම. |
| (xi) | 13 | වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම. |

**2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත**

| වගන්තිය | | වරදේ ස්වභාවය |
|---|---|---|
| (i) | 2 | පනත යටතේ වැරදි. |

**1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත**

| වගන්තිය | | වරදේ ස්වභාවය |
|---|---|---|
| (i) | 2 | වධදීම වරදක් වන බව. |

**2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 3 | පනත යටතේ වැරදි. |

**(182 වන අධිකාරය වූ) තුවක්කු ආඥාපනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 22 | තුවක්කුවක් සන්තකයේ තබාගැනීමට බලපත්‍රයක් ලබා ගැනීම පැහැර හැරීම. |
| (ii) | 44 | යම් විශේෂිත දඬුවමක් පනවා නොමැති වැරදි හැර 182 වන අධිකාරය යටතේ වැරදි. |

**(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 45(1)(අ) සිට (ග) දක්වා | ආගාමික හා විගාමික වැරදි. |
| (ii) | 45(2) | 45(1)(අ) සිට (ග) දක්වා වූ වගන්තිවල නිශ්චිතව දක්වා ඇති වැරදි සිදුකිරීමට සූදානම් වීම, තැත් කිරීම හෝ අනුබල දීම. |
| (iii) | 45අ(1)(අ) සිට (ඇ) | පනත උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට තැනැත්තන් රැගෙන ඒමේ වැරදි. |
| (iv) | 45අ(2)(අ) සහ (ආ) | 45අ(1)(අ) සිට (ඇ) දක්වා වූ වගන්තිවල නිශ්චිතව දැක්වෙන වැරදි සිදුකිරීමට තැත් කිරීම, අනුබල දීම හෝ සූදානම් වීම. |
| (v) | 45ඇ(1)(අ) | සංවිධානය කිරීමේ වරද. |
| (vi) | 45ඇ(1)(ආ) | සංවිධානය වීමට උත්සාහ කිරීම හෝ සංවිධානය වීමට සූදානම් වීමක් වශයෙන් යම් ක්‍රියාවක් සිදු කිරීම හෝ එසේ සංවිධානය වීමට ආධාර හා අනුබල ලබා දීම. |

### 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 177 | යම් ලේබනයක සටහන් වංක ලෙස වෙනස් කිරීම. |
| (ii) | 178(1) සහ (2) | II වන කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම. |
| (iii) | 179 | කාර්මික සැලසුම් උල්ලංඝනය කිරීම. |
| (iv) | 181 | පේටන්ට් බලපත්‍ර උල්ලංඝනය කිරීම. |
| (v) | 184 | ලකුණු උල්ලංඝනය කිරීම. |

### 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 2 | පොදු දේපළ විෂයයෙහි ලා අනර්ථය සිදු කිරීම. |
| (ii) | 3 | පොදු දේපළ සොරකම් කිරීම. |
| (iii) | 4 | පොදු දේපළ කොල්ලකෑම. |
| (iv) | 5 | වංක ව්‍යපහරණය, සාපරාධ විශ්වාස කඩ කිරීම, වංචා කිරීම, ව්‍යාජ ලේඛන සෑදීම සහ ගිණුම් වරදවා පෙන්වීම. |
| (v) | 10 | වැරදි සිදු කිරීමට තැත් කිරීම. |

### 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 2 | පීඩාකාරී ආයුධ ආනයනය කිරීම යනාදිය. |
| (ii) | 3 | පීඩාකාරී ආයුධ භාවිත කිරීම මගින් දේපළ ආදියට අලාභ සිදු කිරීම යනාදිය. |
| (iii) | 4 | පීඩාකාරී ආයුධවලින් තුවාල සිදු කිරීම හෝ පීඩාකාරී ආයුධවලින් මරණය නැතහොත් තුවාල සිදු කිරීමට තැත් කිරීම. |
| (iv) | 5 | පනතේ 4 වන වගන්තිය යටතේ වූ වැරදි හැර වෙනත් වැරදි සිදු කිරීමට තැත් කිරීම. |

**2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 3 | ගෙවීම් උපක්‍රම වංචා සංයුක්ත වන ක්‍රියා. |
| (ii) | 4 | පනත යටතේ වැරදි සිදු කිරීමට තැත් කිරීම. |
| (iii) | 5 | පනත යටතේ වරදකට අනුබල දීම. |
| (iv) | 6 | පනත යටතේ වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම. |

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 101,102,113අ සහ 113ආ | මේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති දණ්ඩ නීති සංග්‍රහයේ යම් වරදක් සිදු කිරීමට අනුබල දීම සහ කුමන්ත්‍රණය කිරීම. |
| (ii) | 114 සිට 123 (එම වගන්ති දෙක ද ඇතුළුව) | රාජ්‍ය විරෝධී වැරදි. |
| (iii) | 141 | යම් මාරක ආයුධයක් ඇතිව නීති විරෝධී රැස්වීමකට එකතු වීම. |
| (iv) | 145 | මාරක ආයුධයක් ඇතිව කැරලි ගැසීම. |
| (v) | 190 සිට 224 (එම වගන්ති දෙක ද ඇතුළුව) | බොරු සාක්ෂි දීම හෝ සෑදීම සහ මහජන යුක්ති ධර්මයට විරුද්ධ වැරදි. |
| (vi) | 226 සිට 256 (එම වගන්ති දෙක ද ඇතුළුව) | කාසි හා ආණ්ඩුවේ මුද්දර පිළිබඳ වැරදි. |
| (vii) | 286අ | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළකිරීම්, ප්‍රදර්ශන යනාදිය. |
| (viii) | 288 | ළමයින්ට සිඟා කෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම. |

| | | |
|---|---|---|
| (ix) | 288අ | ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම. |
| (x) | 288ආ | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම. |
| (xi) | 296,297, 300 සහ 301 | මිනී මැරුම, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සහ ඊට තැත් කිරීම. |
| (xii) | 303 සිට 309 (එම වගන්ති දෙක ද ඇතුළුව) | ගබ්සා කිරීම හෝ නූපන් දරුවන්ට පාඩු කිරීම, ළදරුවන් අත්හැරයාම හා දරු උපත් සැඟවීම. |
| (xiii) | 308අ | ළමයින් කෲරත්වයට භාජනය කිරීම. |
| (xiv) | 315 සිට 324 (එම වගන්ති දෙක ද ඇතුළුව) | අන්තරාදයක ආයුධවලින් කැමැත්තෙන්ම තුවාල සිදු කිරීම යනාදිය. |
| (xv) | 334 සිට 339 (එම වගන්ති දෙක ද ඇතුළුව) | අයුතු ලෙස සිරකර තැබීම යනාදිය. |
| (xvi) | 344 | තම යුතුකම ඉෂ්ට කිරීමෙන් වැළැක්වීම සඳහා රජයේ සේවකයකුට සාපරාධී බලහත්කාරය පෑම. |
| (xvii) | 345 | ලිංගික අතවර කිරීම. |
| (xviii) | 354 | අපහරණය. |
| (xix) | 355 සිට 359 (එම වගන්ති දෙක ද ඇතුළුව) | අපහරණය කිරීම සහ පැහැර ගෙනයාම පිළිබඳ බරපතල ආකාරයේ වැරදි. |
| (xx) | 358අ | ණය බැඳුම්කරයට හෝ දාසභාවයට පත් කිරීම, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම, වහල්කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම. |
| (xxi) | 360 | වයස අවුරුදු දහයට අඩු දරුවකු පැහැරගෙන යාම හෝ අපහරණය. |
| (xxii) | 360අ | කුට්ටනය. |
| (xxiii) | 360ආ | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම. |

| | | |
|---|---|---|
| (xxiv) | 360ඈ | තැනැත්තන් වෙළෙඳාම් කිරීම. |
| (xxv) | 360ඈ | දරුකමට හදා ගැනීමට අදාළ වැරදි. |
| (xxvi) | 360ඉ | ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම. |
| (xxvii) | 364 | ස්ත්‍රී දූෂණය. |
| (xxviii) | 364අ | ව්‍යභිචාරය. |
| (xxix) | 365 | අස්වාභාවික වැරදි. |
| (xxx) | 365අ | තැනැත්තන් අතර දූඩි අශිෂ්ට ක්‍රියා. |
| (xxxi) | 365ආ | බරපතල ලිංගික අපයෝජනය. |
| (xxxii) | 367 සිට 371 (එම වගන්ති දෙක ද ඇතුළුව) | සොරකම, ගවයන් සොරකම් කිරීම යනාදිය. |
| (xxxiii) | 373 සිට 378 (එම වගන්ති දෙක ද ඇතුළුව) | බලෙන් ලබා ගැනීම යනාදිය. |
| (xxxiv) | 380 සිට 385 (එම වගන්ති දෙක ද ඇතුළුව) | කොල්ලකෑම යනාදිය. |
| (xxxv) | 387 | වංක පරිහරණය. |
| (xxxvi) | 389 සිට 392 (එම වගන්ති දෙක ද ඇතුළුව) | සාපරාධී විශ්වාස කඩ කිරීම. |
| (xxxvii) | 394 සිට 396 (එම වගන්ති දෙක ද ඇතුළුව) | සොරබඩු වංක ලෙස භාර ගැනීම යනාදිය. |
| (xxxviii) | 400 සිට 403 (එම වගන්ති දෙක ද ඇතුළුව) | වංචා කිරීම. |

| | | |
|---|---|---|
| (xxxix) | 404 සිට 407 (එම වගන්ති දෙක ද ඇතුළුව) | වංචක ඔප්පු සහ වංචක ලෙස දේපළ ඉවත් කිරීම යනාදිය. |
| (xL) | 412 සිට 416 (එම වගන්ති දෙක ද ඇතුළුව) | සතුනට, වාරි කර්මාන්තවලට සහ ප්‍රසිද්ධ පාරවල් යනාදියට අනර්ථය සිදු කිරීම. |
| (xLi) | 418 සිට 426 (එම වගන්ති දෙක ද ඇතුළුව) | අනර්ථය යනාදිය. |
| (xLii) | 435 සිට 451 (එම වගන්ති දෙක ද ඇතුළුව) | ගෙයකට අයුතු ඇතුළු වීම, ගෙවල් බිඳීම යනාදිය. |
| (xLiii) | 454 සිට 467 (එම වගන්ති දෙක ද ඇතුළුව) | කූට ලේඛන සෑදීම, අන්තිම කැමති පත්‍රයක් යනාදිය වංචනික ලෙස අවලංගු කිරීම සහ ගිණුම් වරදවා දැක්වීම. |
| (xLiv) | 478අ සිට 478ඈ (එම වගන්ති දෙක ද ඇතුළුව) | මුදල් නෝට්ටු හෝ බැංකු නෝට්ටුවලට අදාළ වැරදි. |
| (xLv) | 490 | මේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සිදු කිරීමට තැත් කිරීම. |

**(218 වන අධිකාරය වූ) විස වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥාපනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 54අ | අන්තරාදායක ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, ජාවාරම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හා සන්තකයේ තබා ගැනීම. |
| (ii) | 54ආ | 54අ වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට අනුබල දීම. |
| (iii) | 78 | 218 වන අධිකාරයේ විධිවිධාන හෝ එය යටතේ නීත්‍යානුකූලව දෙන ලද යම් නියෝගයක්, නියමයක් හෝ විධානයක් උල්ලංඝනය කිරීම හෝ එවැන්නකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම. |

**2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 3(1) | මුදල් විශුද්ධිකරණ වරද. |
| (ii) | 3(2) | මුදල් විශුද්ධිකරණ වරද සිදු කිරීමට තැත් කිරීම, කුමන්ත්‍රණය කිරීම සහ එම වරද කිරීමට ආධාර හෝ අනුබල දීම. |

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 2 | පනත යටතේ වැරදි සහ දණ්ඩන. |
| (ii) | 3 | පනත යටතේ වරදක් සිදු කිරීම පිණිස සූදානම් වීම, අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම හෝ පෙළඹවීම. |

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත**

| | *වගන්තිය* | *වරදේ ස්වභාවය* |
|---|---|---|
| (i) | 64 | ගාස්තු අයකිරීම වරදක් බව.". |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.